
# තැනිබිමේ මිහිදන් වූ පුරය



උතුරු මැද කටුක තැනිතලාවේ පිහිටි අනුරාධපුරය මුල් ම සිංහල පාලන අගනගරය යි. ක්‍රි.පූ. 437 දී එය රාජධානියක් බවට පත් විය. ක්‍රි.ව. 2වන සියවසේ දී අ`දින ලද ටොලමිගේ සිතියමේ අනුරාධපුරය දක්වා ඇත්තේ අනුරොග්‍රාමම් යනුවෙනි. ඉන් අදහස් වන්නේ එය ඒ වන විට ද ගමක් වශයෙන් පැවැති බවයි. පුර යන්නෙහි අරුත නගරය හෝ අගනගරය යන්නයි. අනුරාධ ගම අනුරාධ පුරයක් බවට පත් ව ඇති බව එයින් අරුත් ගන්වයි.

ක්‍රි.ව. 4 වන සියවස අගභාගය වන විට මෙම නගරයේ පැවැති ශ්‍රී විභූතිය, චීන දේශාටක ෆාහ්සියෙන් නැමැති උගත් බෞද්ධ භිකෂුව තබා ඇති සටහන්වලින් හෙළි වෙයි. අනුරාධපුරයට ඇති දීර්ඝ හා පෞඪ ඉතිහාසය වෙනත් ජාතීන්ගේ ඉතිහාසයන් හා සස`දන විට විමතිය දනවන සුළු ය. මෙය වරින්වර ආක්‍රමණික පරසතුරන් විසින් වනසන ලදුව සත් වරක් ම යළි නගා සිටුවන ලද නගරයකි. උන්නතිකාමි රාජකීය පෙළපත් ඔවුන්ගේ රාජකීය විජයග්‍රහණයන්ගේ යශෝරාවයන් මෙන්ම ඛේදනීය ඇදවැටීම් ද අනුරාධපුර ඉතිහාසය පුරා සනිටුහන් ව තිබේ. දිවයිනේ ප්‍රමුඛ නගරය ලෙස වසර 1200ක් පැවැති අනුරාධපුරය ක්‍රි. ව. 1071දී අත්හැය යෑමට ලක්වීමෙන් හුදකලා විය. මෙම (18වන) සියවසේ මැද මංමාවත් තැනීමෙන් ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසයට එක් වූ මේජර් ස්කිනර් අරිප්පු සිට අනුරාධපුරය දක්වා සැතපුම් 40ක මගක් තැනීමට සිය බලඇණි මෙහෙයවද්දී දුටු “ගල්ටැම් ලොවක්” නිසා මවිතයට පත් විය. සිය ඇස ගැටුණු ඒ ලෝකයේ තිබුණු පාළුව හුදකලාව නිසා හේ කම්පිත විය. ස්කිනර්ට වසර 30කට පසු ලීස්චින් (Liesching) නැමැති තරුණ සිවිල් නිලධාරියා සිය හුදකලාව විසින් පොළඹවන ලදුව මෙසේ ලියයි.

අනුරාධපුරය මරණයේ නගරයයි. අතීත ස්මාරකයක් ඇස නොගැටී පියවරක් හෝ තබනු අසීරුය. පාවල ගැටෙනා ගඩොල් කැබලි නටඹුන් රජ මාළිගාවල ශේෂයෝය. කණු, දොරටු පඩි, ගලින් ම කළ දොරටුපාල රූ ඇතැම් තැන්වල මතු වී පෙනෙයි. තෙරක් නැති දැවැන්ත නටඹුන් සමූහය අතර ඇති ගුප්ත නිහැඬියාව අතරින් එදා රජවරුන්, කුමරකුමරියන් මාළිගා අංගන වලින් පුළුල් පැදකුණු මංවලට පිවිස වෙහෙරවිහාර වලට පෙරහැරින් සම්ප්‍රාප්ත වන නාදය නිම්නාද වෙයි. සෙසු දිස්ත්‍රික්ක හා සසදන කළ සියවසකට පෙර අනුරාධපුරය සැලකුණේ කිසි කමකට නැති, ව්‍යසනය මිස කිසි වගතුවකට නැති දිස්ත්‍රික්කයක් ලෙසියි. මෙම ප්‍රදේශයේ උන්නතිය සඳහා කෙරුණු දෑ අල්පය. එය ලෝකයාට මුළුමනින් ම වසන්ව තිබුණු ලාංකිකයන් අතර වුව වැඩි දැන හැඳුනුම්කමක් නොතිබුණු වැළලුණු නගරයක් විය.

අනුරාධපුරය ගැන ලිස්චින් තැබූ සමරු සටහන් නිසා “ඈත හා මෑත පෙරදිග පසුගාමී රටවල්” ලෙස බටහිර ලෝකය හඳුනාගෙන තිබූ රටවල ඉතිහාසය හා පුරාවිද්‍යාව ගැන ඔවුන් තුළ නව ප්‍රබෝධයක් ඇති විය. ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ උරුමයන් වෙත නිරායාසයෙන් ම ඔවුන්ගේ විශේෂ අවධානය යොමු විය. ඉන්දියාවේ පුරාවිද්‍යා ගවේෂණ අංශය 1868 දී ස්ථාපිත කෙරුණු අතර ඉන් වසර 7කට පසු ශ්‍රී ලංකාවේ වනගත හුදකලා පෙදෙස්වල තිබූ වැළලුණු නගර හා ධනනිධාන ගැන තොරතුරු රැස්කිරීම ඇරඹිණි. එය බ්‍රිතාන්‍යයන්ට මහත් ආශ්වාදජනක කටයුත්තක් විය. එවකට ගවේෂණ අධ්‍යකෂ ලූතිනන් කර්නල් ෆයර්, ස්මාරක සංරකෂණය අරඹුවා පමණක් නොව පුරාවිද්‍යාව පිළිබඳ ව ශ්‍රී ලාංකිකයන්ගේ උද්‍යෝගය ද අවුළුවා ලීය. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව අවශ්‍යයෙන් ම අසහාය මුනිවර බුදුන්ගේ ඉගැන්වීම්, බ්‍රාහ්මන දේව ඇදහිලි, පූර්ව බෞද්ධ සත්ව වන්දනය හා අවියෝජනීය ව බැඳී පවතියි. තවමත් ජීවමාන ආගම් දෙකක් මේවායෙන් සංකේතවත් වෙයි. එම නිසා මෙරට ජනගහණයෙන් බහුතරය මෙම නටඹුන් සලකනුයේ පුරාතන ශිෂ්ටාචාරයක් සනිටුහන් කරන ඓතිහාසික විද්‍යාත්මක සාක්ෂ්‍ය ලෙස නොව සිය ආගමට අයත් ලෝකායත, පූජනීය ස්ථාන ලෙසයි. කලකට ඉහත මළ ආගම් සහිත රටවල කරන අධ්‍යයනවල දී තරම් ඉක්මනින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා අධ්‍යයනයන් හා සංරකෂණයන් කළ නොහැක්කේ එහෙයිනි.









(උපුටාගැනීම “දිනිති” සගරාව)